# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2314/40 - 2023 ජනවාරි මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2023.01.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ සභිකධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ අංක 11 කන්දපුරම් කොට්ඨාසයට තේරී පත් වූ තුරයිසාමි නඩරාජසිංහම් අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ, අංක 11 කන්දපුරම් කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා පුණ්‍යමූර්ති විජයකුමාරන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි ජේසුදාසන් ජෙනිටන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් පුණ්‍යමූර්ති විජයකුමාරන්, වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ, අංක 11, කන්දපුරම් කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරාපත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ජේ. ජෙනිටන්,
තේරීම්භාර නිලධාරි,
වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාව.

2023 ජනවාරි මස 12 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
වවුනියාව.

EOG 01-0114